www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දකුනු අප්‍රිකානු රාජ්‍ය සේවක වැඩවර්ජනයේ ජාත්‍යන්තර පාඩම්

## International lessons of the South African public service strike

**2010 සැප්තැම්බර් 13**

ජොහැන්නෙස්බර්ග්හි පැවති රැස්වීමක දී වර්ජක රාජ්‍ය සේවකයන් වෙත තෙදින වැඩ වර්ජනය නිමා වූ බව නිවේදනය කිරීමට පැමිනි වෘත්තීය සමිති නායකයින් කම්කරුවන් විසින් පලවා හැරින. මෙම සිදුවීම, කම්කරුවන් සහ වෘත්තීය සමිති නිලධරය අතර ජාත්‍යන්තර වසයෙන් තියුනු වෙමින් පවත්නා ඝට්ටනය පිලිබඳ වැදගත් ඇඟවුමකි.

වර්ජනය ආරම්භයේදී ආන්ඩුව කම්කරුවන්ට ගෙවීමට එකඟවූ වැටුප් වැඩිවීමට වඩා සියයට 0.5 ක් වැඩි වැටුප් දීමනාවක් පිලිගැනීමට දකුනු අප්‍රිකානු රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකඟත්වය පල කලේය. ඔවුන් තම සාමාජිකයන් මත ගිවිසුම පැටවීමට තැත් කරන්නේ, කම්කරුවන් පොලිස් ප්‍රහාරයන්ට ගොදුරු කරනු ලැබූ, එමෙන්ම රෝහල්වලට සන්නද්ධ හමුදා යෙදවූ සහ වර්ජනයට එරෙහිව උසාවි නියෝග පැනවූ දිග් ගැස්සුන අරගලයකින් අනතුරුවය.

"සාමාජිකයෝ කෝපයට පත්ව සිටිති. තමන්ගේ විරුද්ධත්වය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් ලෙස සාමාජික කාඩ් පත් ගිනි තැබීමට ජාතික කාර්යාලය වෙත යාමට ඔවුන්ට අවශ්‍ය වී" යැයි රැස්වීමෙන් පසු ජාතික අධ්‍යාපනික සෞඛ්‍ය සහ ඒකාබද්ධ කම්කරු සමිතියේ සාමාජික ඩිට්වානි රාමාරුමෝ වාර්තාකරුවන්ට පැවසීය.

"වර්ජනය අත්හිටුවීමට වෘත්තීය සමිති නායකත්වය ගත් තීන්දුවට විරුද්ධත්වය පාන අප සාමාජිකයන්ගේ බරපතල ප්‍රතිවිරෝධයකට අපි මුහුන දී සිටිනවා," යයි නම් සඳහන් කිරීමට අකැමැති වූ එක් වෘත්තීය සමිති නිලධාරියෙක් කීවේය.

"අපි ඔවුන්ට විකුනලා තියෙන්නේ පුස්සක් කියලා බොහෝ අය කියනවා," එම නිලධාරියා තවදුරටත් කීවේය.

සටන් රැල්ල අනෙකුත් කාර්මික අංශවලට පැතිර යාමේ තර්ජනය මතුවෙත්ම වෘත්තීය සමිති වැඩවර්ජනය අත්හිටුවීය. දකුනු අප්‍රිකානු ලෝහ කම්කරුවන්ගේ ජාතික වෘත්තීය සමිති සාමාජිකයන් සියයට 15ක වැටුප් වැඩිවීමක් වෙනුවෙන් සහය පලකරමින් වර්ජනයට සහභාගී වූවේය. ඔවුහු කුඩා මෝටර් රථ කර්මාන්ත සහ ඉන්ධන අලෙවිකරුවන්ගේ සංගමයට ලිපියක් ඉදිරිපත් කිරීමට බ්‍රහස්පතින්දා දින පෝට් එලිසබත් හරහා පා ගමනින් ගියහ.

පතල් කම්කරුවන්ගේ ජාතික වෘත්තීය සමිතියේ (එන්යූඑම්) සාමාජිකයන් වන ප්ලැටිනම් පතල් කම්කරුවෝ අගෝස්තු 23 වෙනි දින සිට වර්ජනයේ නිරතව සිටිති.

පොලිසියේ හා මිලිටරියේ අංශ පවා රාජ්‍ය සේවකයන්ගේ වර්ජනයට සම්බන්ධ වීමේ හැකියාව පිලිබඳව සාකච්ඡා කර තිබේ. ඔවුන්ගේ සහභාගිත්වය වලක්වමින් ආන්ඩුව උසාවි නියෝගය ලබාගත් විට ඔවුන්ට එය අතහැරීමට සිදුවිය.

වාර්ෂික වැටුප් සාකච්ඡා සමඟ ඇවිලීගිය වර්ජන මාලාව දකුනු අප්‍රිකානු සමාජයේ යටපත්කර පැවති ආතතීන් එලිමහනට පමුනුවන ව්‍යාපාරයක් බවට වේගයෙන් වර්ධනය වී ඇත. ජෙනරල් ස්ට්‍රයිකයක කේන්ද්‍රය වෙමින් පවතින මිලියන 1.3ක රාජ්‍ය කම්කරුවන් ඇරැඹූ වැඩ වර්ජනයට වැට බැඳීම පිනිස වෘත්තීය සමිති ක්‍රියා කලේය. එවැනි ව්‍යාපාරයක්, නාගරික ප්‍රදේශවල අසංවිධානාත්මක කම්කරුවන්ගෙන් බහුතරයකගේ සමාජ අසංතුෂ්ටිය සමඟ බද්ධ වනු ඇත. ඔවුහු අත්‍යවශ්‍ය සේවාවන් සැපයීමෙහිලා ආන්ඩුවේ අසමත්කමට එරෙහිව සීඝ්‍රයෙන් වැඩෙන ප්‍රතිරෝධයක් දක්වමින් සිටිති.

වර්ජනය නතර කිරීමෙහිලා මාධ්‍ය තුලින් ගෙනයන අපවාද ව්‍යාපාරයට සහ වීදිවල මර්දනය ක්‍රියාත්මක කිරීමෙන් එය නතර කිරීමේ හැකියාවක්

ආන්ඩුවට නොමැති බව පැහැදිලි වෙත්ම වෘත්තීය සමිති කඩිමුඩියේම වැඩ වර්ජනය අත්හිටුවීමට කටයුතු කලහ. මෙම අර්බුදය මධ්‍යයේ ඔවුන් ක්‍රියා කර ඇත්තේ අප්‍රිකානු ජාතික කොන්ග්‍රස් (ඒඑන්සී) ආන්ඩුවේ ප්‍රමුඛ අතවැසියා ලෙසිනි.

දකුනු අප්‍රිකානු වෘත්තීය සමිති සම්මේලනය (කොසාටු) ආරම්භයේ පටන්ම වර්ජනයට එරෙහිව සිටියේය. එය, වර්ජන ක්‍රියාමාර්ගය ලෝක කුසලාන පාපන්දු තරගය නිමා වෙන තෙක් පමා කලේ එනයින් ආන්ඩුව අපහසුතාවට පත් නොකල යුතු බව කියමිනි. අවසානයේදී සුලු වෘත්තීය සමිති සම්මේලනය වන ස්වාධීන වෘත්තීය සමිති කොන්ග්‍රසය එහි සාමාජිකත්වයේ කෝපය නිසාවෙන් වර්ජන ක්‍රියාමාර්ගයට යාමට කැමත්ත පල කල විට පමනක් කොසාටුවට ඒ සඳහා සහය දීමට බල කෙරින.

කොසාටු මහ ලේකම් වෙලින්සිමා වෙවි තමන්ගේ අති වාමාංශික වාචාල කථා උපයෝගි කර ගත්තේ වර්ජනයේ පාලනය හසුරුවා ගැනීමට දැරූ වෑයමේදී පමනකි. ඔහු ආන්ඩුවේ ඇමතිවරුන්ට බැන අඬ ගැසූ අතර එලැඹෙන වසරේ පලාත් පාලන මැතිවරනයේදී ජනාධිපති ජේකබ් සූමාට වෘත්තීය සමිතිවල සහය නොදෙන බවට ගිගිරුවේය. ජේකබ් සූමාගේ පුත් ඩුඩූසන් සූමා, ආර්සෙලර් මිටාල් සමඟ හවුල් ගනුදෙනුවකින් වාසි ලැබූ ආකාරය ඔහු විසින් හෙලිකල අතර කලු ආර්ථික බලගැන්වීමේ වැඩ පිලිවෙල මඟින් නිර්මානය කරනු ලැබ ඇති ධනවත් ව්‍යාපාරික ස්ථරයක් වශයෙන් "කොල්ලකාරී පැලැන්තියක්" ඒඑන්සීය තුලින් ඉස්මතු වීම දෙසටත් ඇඟිල්ල දිගු කලේය.

වර්ජනයේ හිනිපෙත්තේදී කොසාටු බේරාගැනීමෙහිලා වෙවීගේ වාචාල කථා සාර්ථක වූ අතර එක් සන්ධිස්ථානයකදී වර්ජනය අත්හිටුවීමට ඒවා යොදා ගැනින. කම්කරුවන් කෝපයටත් සිත් තැවුලටත් පත් වූ නමුත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් නැවත සිය රැකියාවන්ට පිටත් ව ගියහ.

තම සාමාජිකයන් මත ප්‍රහාර එල්ල කරන රාජ්‍යය සහ හාම්පුතුන්ගේ ඒජන්තයන් ලෙසත් පන්ති අරගලයේ සතුරන් ලෙසත් නිල වෘත්තීය සමිතිවල විශ්ව ව්‍යාප්ත භූමිකාව මෙම පාවාදීම ඔස්සේ ඉස්මත්තට පැමිනෙයි.

කොසාටු හා දකුනු අප්‍රිකානු කොමියුනිස්ට් පක්ෂයෙහි ක්‍රියාමාර්ගයේ මුලුමහත් ධාවනය යොමුව පවතින්නේ සිය හවුල්කාර ආන්ඩුව එනම්, ඒඑන්සීය ප්‍රගතිශීලීය යන මිත්‍යාව පෝෂනය කිරීමටය. වර්නභේදවාදයට එරෙහිව ඒඑන්සීය පූර්වයෙන් අරගල කල තැන් පටන් එක දිගට වෘත්තීය සමිති එයට සමීපස්තව ගැට ගැසී සිටිති. එහෙත් මෙම සම්බන්ධතාවට දෙනු ලැබූ ප්‍රගතිශීලි රශ්මි කදම්බය, ධනේශ්වර ජාතිකවාදී ඒඑන්සීය බලයට පැමිනි තැන් පටන් මුලුමනින්ම හෙලිදරව් වෙමින් තිබේ.

ඒඑන්සීය වර්නභේදවාදයට එරෙහි ව්‍යාපාරයේ මුදුනෙහි සිටි කාලයේ එහි වැඩපිලිවෙල මුලුමනින්ම ධනවාදී එකක්ව තිබියදී පවා වැඩකරන ජනයාගේ වීරයෙක් වසයෙන් පෙනී සිටීමට එයට හැකියාව පැවතින. සාර්ථක ධනවාදී ආර්ථිකයක් වර්ධනය කිරීමට අරගල කරමින් එය බලයේ සිටින මේ මොහොතේ එය සහ කම්කරු පන්තිය අතර අනිවාර්ය ගැටුම තියුනු ආකාරයකින් පුපුරා ගොස් තිබේ.

එය හුදෙක් සූමාගේ පුත්‍රයාගේ හෝ විදෙස් සමාගම් සමඟ ගනුදෙනුවලින් වරදාන ලබන දේශපාලන පැලැන්තියේ අනෙකුත් ප්‍රමුඛ සාමාජිකයන්ගේ හෝ පෞද්ගලික "දූෂිතකම්" පිලිබඳ ප්‍රශ්නයක් නොවේ. ඒඑන්සී සහ ලෝක අධිරාජ්‍යවාදය විසින් නියෝජනය කරන නව කලු ධනපති පන්තිය සහ අධිරාජ්‍යවාදය අතර වඩා දුරට යන්නාවූ සබඳතාව එය විසින් ප්‍රකාශයට පත් කෙරෙයි.

තමන්ගේ පාර්ශවයේදී වෘත්තීය සමිති නිලධරය ආන්ඩුව තුල එය ඉටු කරන්නාවූ භූමිකාව සහ කලමනාකාරිත්වය සමඟ එයට ඇති සමීප සබඳතා හරහා මහත් වරප්‍රසාදිත තත්වයක් අත්කර ගෙන සිටිති. ඕනෑම වියදමකින් පහලින් එන තර්ජනයට එරෙහිව එම තත්වය ආරක්ෂා කර ගැනීමට එය අදිටන් කර සිටී. වෘත්තියෙන් හිටපු පතල් කම්කරුවෙකු වූ දැන් කොසාටු නායක සිරිල් රාමාපෝසා පැහදිලි කල ආකාරයට, ඒඑන්සීයේ ඉහල දේශපාලන තනතුරු සඳහා ද ව්‍යාපාරික ක්ෂේත්‍රයේ සුපිරි ගෙවීම් සහිත රැකියා ලබා ගැනීම සඳහා ද ස්ටැලින්වාදීන් සමඟ ඇති සමීප සබඳතා හා වෘත්තීය සමිති තනතුරු, සාර්ථක ලෙස උපයෝගී කර ගෙන ඇත්තේ සුලු පිරිසක් නම් නොවේ.

ජාත්‍යන්තර සමාජවාදියෝ, දකුනු අප්‍රිකානු ඇමන්ඩ්ලා සඟරාව සහ අනෙකුත් මධ්‍යම-පන්තික

දේශපාලන කන්ඩායම් සඳහන් කොට ඇත්තේ ආන්ඩුව වැටුප් වැඩිවීමක් ලබාදීමට පියවර ගැනීම පසුබෑමක් වූ බවත් කම්කරුවන් සඳහා එය පාර්ශවීය ජයග්‍රහනක් පවා පෙන්නුම් කරන බවත්ය. ඒ වැරැදි පියවර හෝ මේ අත්වැරැද්ද වෙනුවෙනුත්, අතන වැරැදි උපාය හෝ මෙතැන ප්‍රවේශයේදී පමන ඉක්මවා ප්‍රවේශම්වීම පිලිබඳවත් ඔවුහු, කොසාටු නායකයන් විවේචනය කරති. එයද ඉක්මවා ඔවුහු වැඩ වර්ජනය අත්හිටුවීම " දූර්දාන්ත" යැයි කීමට තරම් ඉදිරියට යති.

එහෙත් ඔවුන් නියත ලෙසම විස්වාසය පල කරන්නේ සහ කම්කරුවන්ට ද එම විශ්වාසය ඇතිකිරීමට ඔවුන්ට අවශ්‍යව ඇත්තේ, වෘත්තීය සමිතිවලට යලි පනපෙවිය හැකි බවත් කම්කරු පන්තිය නියම මඟ ඔස්සේ මෙහෙයවිය හැකි එකම සංවිධාන ඒවා බවට දිවිරීම සඳහාය. එහි අර්ථය වන්නේ, කම්කරුවන්ගේ අවශ්‍යතා ප්‍රගතිශීලී ලෙසත් තත්‍ය වසයෙන්මත් නියෝජනය කල හැකි ඇතැම් කොටස් හා ප්‍රවනතාවන් සොයා යාම හරහා කම්කරු පන්තිය ඒඑන්සීයට අර්ථ ශූන්‍ය මාවත් ඔස්සේ එක දිගට යටත් කර තබා ගැනීමයි.

මෙම වැඩ වර්ජනයේදී කොසාටුවේ වාර්තාව, වෘත්තීය සමිතිවාදයේ ස්වාභාවය පිලිබඳව කදිම නිදසුනකි. නාමික ලෙස ලෝකයේ වඩාත්ම "සටන්කාමී" වෘත්තිය සමිති සම්මේලනය, මිලියනකට අධික කම්කරුවන් රාජ්‍යයේ බලවේග සමඟ ඍජු ගැටුමට පැමින වූ වර්ජන ක්‍රියාවලිය තුලදී, කම්කරු පන්තියට එරෙහිව ප්‍රාග්ධනයේ හාම්පුතුන් සමඟ අත්වැල් බැඳගෙන තිබේ. මෙය, කම්කරු පන්තිය සඳහා ජාත්‍යන්තර අර්ථභාරයකින් යුත් අත්දැකීමකි.

පසුගිය දශක ගනනාවේදීම, ලෝක ආර්ථිකය වේගයෙන් ඒකාග්‍රවී තිබිය දී වෘත්තීය සමිතිවලට, කම්කරු පන්තියේ සමාජ කොන්දේසිවල වර්ධනයට හේතුවන හෝ වැඩි දියුනු ප්‍රතිසංස්කරන හෝ දිනා දීමට නොහැකිවී තිබේ. අවපාතයේ නිල අනුපාතයට මඳක් ඉහල කුඩා ප්‍රතිශතයක වැටුප් වැඩිවීමක් දිනා සිටින තරමක නිපුන කම්රුවන් පවා කාලයත් සමඟ එය බාදනය වී යෑම අත්දකිනු ඇත.

කම්කරු පන්තියේ අති බහුතරයට වෘත්තීය සමිතිවලින් ගත යුත්තක් නැත. කම්කරුවන්ගේ සැබෑ තත්වය වන දුක් පීඩා, වඩාත් නරක අතට හැරෙමින් පවතින සමාජ කොන්දේසි හා ඉහල නැගෙන විරැකියාව පිලිබඳව නිලධාරී පැලන්තියට ඇත්තේ පරිපූර්න නොතැකීමකි. ඒ වෙනුවට වෘත්තීය සමිති ක්‍රියාත්මක වන්නේ, ගෝලීය ආර්ථික අර්බුදය මධ්‍යයේ, ප්‍රමුඛ බැංකු හා සංගතවලට තම ලාභ පොදි තරකර ගැනීමට හැකිවන අයුරින් පටිතදකිරීමේ පියවර ක්‍රියාවට දමන ආන්ඩුවල සහකරුවන් ලෙසිනි.

ජාත්‍යන්තරව කම්කරුවන් සහ තරුනයින් දකුනු අප්‍රිකානු රාජ්‍ය සේවක වැඩ වර්ජනයේ අත්දැකීම්වලින් බැරැරුම් පාඩම් උකහා ගත යුතුය. වෘත්තීය සමිතිවලින් නියත ලෙසම බෙදී වෙන් වී ගැනීමේ අවශ්‍යතාවත් ජාත්‍යන්තර සමාජවාදී ඉදිරි දර්ශනයක පදනම මත නව දේශපාලන නායකත්වයක් සහ පන්ති අරගලයේ නව සංවිධාන ගොඩ නැඟීමත් ඉන් අවධාරනය කෙරේ.

ඈන් ටැල්බට්

© www.wsws.org